**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 12 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදු කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් සංකේත - 2003.04.00 රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරුපැදි සම්බන්ධ මූලික ගෙවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාළව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් ඉහත කී ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි. එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාල නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරීම අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද, එම වැඩසටහනට අදාලව මූලික ගෙවීම ලෙස රු.2,910,000 ක ශුද්ධ ආදායමක් 2021 වර්ෂයේදී ලැබී තිබුණි. ඒ අනුව අදාළ අයවැය යෝජනාව ක්‍රියාත්මක කර අවසන්ව තිබියදීත්, ඊට අදාළ විධිමත් උපදෙස් ලබා දෙමින් ගිණුම් ගත කිරීම අවසන් කර නොතිබුණි. | මෙම වැඩසටහනට අදාලව මූලික මුදල දිස්ත්‍රික් ලේකම් / ආයතන ප්‍රධානීන් විසින් එකතු කර ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා වෙනමම ආදායම් කේතයක් 2003.04.00 හඳුන්වා දී ඇත. එහෙත් එම මුදල අදාල ආයතන විසින් වැරදි සහගත ලෙස ගිණුම්ගත කිරීම, නිවැරදි කිරීමට ගිණුම් සටහන් යෙදීම හේතුවෙන් 2021 වර්ෂයේ මෙම ආදායම් ශීර්ෂය යටතේ සටහන් වී ඇත. 2022 වර්ෂය තුළදී එම සැසඳීම් අවසන් කිරීමට සැලසුම් කර ඇත. | 2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වන බැවින් විධිමත් උපදෙස් සහ මඟපෙන්වීම් සිදු කරමින් ආදායම් ගිණුමේ කටයුතු අවසන් කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම**<br>වැය විෂයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.5,100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිඳු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් විදේශ ගමන්වල නොයෙදීම හා නිවසේ සිට වැඩ කිරීම හේතුවෙන් යන්ත්‍රෝපකරණ භාවිතය අඩු වීම සහ ඇතැම් අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අඩුවීම හෝ | මු.රෙ. 50 ප්‍රකාරව නිවැරදි හා තාත්ත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාත්මක නොවීම හේතු වී ඇත. | |
| (ආ) | **අධි ප්‍රතිපාදන සලසා තිබීම** | | |
| | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 7 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හා 2021.08.30 දිනැති අංක අමප/21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වියදම සීමා කිරීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වීම සිදුවී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව නිවැරදි හා තාත්ත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.3 අත්තිකාරම් ගිණුම

----------------------

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 03 දින වයස අවු. 60 සම්පූර්ණ වී විශ්‍රාම ගිය නිලධාරියෙක්ගේ රු.151,360 ක ණය ශේෂය 2022 මාර්තු 04 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | එම නිලධාරියාට අදාල විශ්‍රාම පාරිතෝෂික මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවා නොමැති අතර, එම මුදල ගෙවීමේදී හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් එම මුදල අය කර ගත යුතු වීම. |
| (ආ) | 2020 සැප්තැම්බර් 18 හා 2021 පෙබරවාරි 16 දිනවල මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙළින් රු.102,499 ක් හා රු.101,561 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | මියගිය නිලධාරියාගේ අදාල ණය මුදල පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත. මියගිය නිලධාරියාගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂයෙන් මේ දක්වා සියයට 85 ක් පමණ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. තව දුරටත් අයවිය යුතු ණය ශේෂ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කිරීමට මුදල් අමාත්‍යාංශයේ නීති අංශයට යොමුකර ඇත. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය සියළු පියවරයන් ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 සැප්තැම්බර් 23 දින රාජකාරියට වාර්තා නොකිරීම හේතුවෙන් සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.150,119 ක ණය ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීම තව දුරටත් ගැටළු සහගත බැවින් එම ණය ශේෂ කපා හැරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට හෝ එසේ අයකර ගැනීමට නොහැකි නම් එම ණය ශේෂ කපා හැරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් මාසය වෙනුවෙන් රු.4,500 ක වියදම් 2022 වර්ෂයේදී ගෙවා තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එය බැදීම් හා බැරකම් යටතේ දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවා තිබූ රු.4500/- ක් 2022 වර්ෂයේ බැදීමක් ලෙස සටහන් කිරීම අතපසුවීමකින් සිදු වී ඇති බව පිළිගනිමි. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමේ අපේක්ෂාවෙන් එළඹ තිබුණු බැරකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් හෙළි දරව් කළ යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 395 (ඌ) | එකතු වන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක් පත් ලිවීම් හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිදු සම්බන්ධතාවයක් නොමැති නිලධාරියෙකු විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ | විගණනය විසින් දක්වා ඇති පරිදි නිලධාරීන් අතර වැඩ පරීක්ෂාවක් වන ලෙසට රාජකාරි පැවරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | චෙක්පත් ලියන නිලධාරියා විසින්ම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි. | | |
| (ආ) | 2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය සෘණ රු.32,732,054 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුවද 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ රු.32,732,054 ක් වී ඇත. නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය ධන (+) රු.32,732,054 ක් විය යුතුව තිබුණත් එය සෘණ සංඛ්‍යාවක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 ක් ලෙස දැක්වීම තාර්කිකව සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව නිසි පරිදි අවසන් ගිණුම් තුළ අග්‍රිම ශේෂ ඉදිරිපත් කිරීම සිදුකර ඇත. | මූල්‍ය ප්‍රකාශන තාර්කිකව පිළියෙළ කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------

**3.1 කාර්යසාධනය**

----------------

**3.1.1 රජයේ අත්තිකාරම් කාර්යයන්ට අදාළ සීමාවන් නොපිළිපැදීම**

---------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 අංක 7 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ සඳහන් රාජ්‍ය අමාත්‍යාංශයක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් සඳහා | මු.රේ.503(2) විධිවිධානයන් පරිදි නියමිත සීමාවන් ඇතුළත ක්‍රියා කරමින් සීමාවල ඉක්මවීම් / පහතවැටීම් ඇතිවීම වලක්වාලීමට කටයුතු කිරීමේ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත | විසර්ජන පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පනවා ඇති සීමාවන් අවශ්‍ය වන පරිදි සංශෝධනය කිරීමට |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙලින් රු.32,000,000 ක් හා රු.17,000,000 ක් බැගින් උපරිම වියදම් සීමාවන් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අමාත්‍යාංශය හා කාර්යාලය විසින් එම සීමාවන් පිළිවෙළින් රු.1,401,679 කින් හා රු.208,590 කින් ඉක්මවා අත්තිකාරම් ගෙවා තිබුණි. | පවරා ඇත. එසේ වුවත් වැලැක්විය නොහැකි යම්කිසි හේතුවක් කරණකොටගෙන ඉක්මවීම / පහත වැටීම ඇතිවීමට කලින් ඒ සඳහා අධිකාරී බලය ලබා ගැනීමට ඉල්ලුම්පත්‍රයක් අදාල මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දින ඉකුත්වීමට ප්‍රථම අනිවාර්යයෙන්ම භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු බවට මෙහි විශේෂයෙන් සඳහන් කර ඇත. මෙහි සඳහන් ආයතන වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණි. | කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2020 අංක 7 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ කොමිෂන් සභා දෙකක් සඳහා අත්තිකාරම් ගිණුමේ අවම සීමාවන් ලෙස පිළිවෙළින් රු.500,000 ක හා රු.200,000 ක වශයෙන් සීමාවන් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම කොමිෂන් සභා ක්‍රියාත්මක නොවීම නිසා ලැබීම් වාර්තා වී නොතිබුණි. ඒ අනුව එම කොමිෂන් සභා විසින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි. | මෙම ආයතන 2 ක අයවැය සම්මත වීමෙන් පසුව අහෝසි වී ගිය බැවින් මෙම සීමාවන් සඳහා තථ්‍ය අගයන් වාර්තා වී නොමැති අතර, අක්‍රිය ආයතන බැවින් සීමා සංශෝධනය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් වී නොමැත. | විසර්ජන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සීමා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.1.2 රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණ කටයුතු

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ව්‍යවසාය 117 ට අදාල ක්‍රියාකාරකම් කිසිවක් අයවැය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ හෝ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර | ජාතික අයවැය දෙපාර්තමේන්තුව එම ආයතනවල මූල්‍ය සම්පාදනය සඳහා සහ වෙනත් විශේෂ අවස්ථාවන්හි ක්‍රියාකාරීව මැදිහත්වීම සිදුකරනු ලබයි. තව ද එම රාජ්‍ය ආයතනවල කාර්යභාරය සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී | දෙපාර්තමේන්තුවේ විෂය පථයට වැටෙන ආයතනවල අධීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කළ යුතු වීම. |

| | |
|---|---|
| නොතිබුණු අතර එම අධීක්ෂණය කිරීමට අදාළ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සැලැස්මට ඒවා ඇතුළත් කර නොමැති අතර, 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී මෙම අධීක්ෂණ කාර්යය ඇතුළත් කිරීමට හැකිවන ලෙස කටයුතු කිරීමට සටහන් කර ගතිමි.<br><br>කෙසේ වුවද, 2022 අයවැය කථාවේ දක්වා ඇති පරිදි සියළුම රාජ්‍ය ආයතන ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කර තිබේ ද යන්න අධීක්ෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමත් සමඟ 2022 වසරේ සිට මෙම ආයතන සම්පව අධීක්ෂණය කිරීමේ මුල් පියවරක් ලෙස එහිදී මෙම අධීක්ෂණය කරන ආයතනයන් පිහිටුවාලීමේ අරමුණු වලට ළඟාවීමේ ප්‍රගතිය නිරීක්ෂණය කොට ඒවා සඳහා අවශ්‍ය මඟපෙන්වීමක් අයවැය දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි. |

### 3.1.3 ජාතික අයවැය සකස් කිරීම

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා අයවැය පිළියෙළ කිරීමට අදාළ මාර්ගෝපදේශයට අනුව 2021 - 2023 රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රකාරව මූලධන වියදම් ඇස්තමේන්තු කළ යුතුව තිබුණි. නමුත් එම රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021 අයවැය අවසන් වීමෙන් පසුව 2021 ජනවාරි 31 දින පිළියෙළ කර තිබීම නිසා 2021 අයවැය ඇස්තමේන්තුවේ මූලධන වියදම් ඇස්තමේන්තු කිරීම එම වැඩසටහනට අනුව සිදුවී නොතිබුණි. | රාජ්‍ය ආයෝජන සැලැස්ම සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර, අයවැයකරණයේදී අදාළ මධ්‍යකාලීන කාලය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය/ අනුමැතිය ලැබී ඇති ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි අන්තර්ගත වන බවට සැලකේ. | මූලධන වියදම් ඇස්තමේන්තු කිරීමේදී රාජ්‍ය ආයෝජන වැඩසටහනට අනුරූපීව සිදු කළ යුතු බැවින්, අයවැය සැකසීමට පෙර රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළියෙල කළ යුතු වීම. |

## 3.1.4 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීම

---

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමි වූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවු. 65 සම්පූර්ණ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා 2013 වර්ෂයේ අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගැනීමකින් තොරව සිදු කර තිබුණි. | 2013 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා ඉදිරිපත් කරන අවස්ථාව වන විට 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වි ස්ථිර ජීවනොපායක් නොමැති වූවන් 10,000 ක පමණ පිරිසක් සිටින බවට ඇස්තමේන්තුගත කර ඇති බව ගොනුව අනුව නිරීක්ෂණය වේ. | අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු විධිමත් අයුරින් ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2015 අයවැය යෝජනාවලදී 1980 රැකියා අහිමි වූ ජූලි වැඩ වර්ජකයන් හට ගෙවනු ලබන දීමනාව රු.5,000 ක සිට රු.6,000 ක් දක්වා වැඩි කිරීමටත්, හිමිකම ලැබීමට අදාළ වයස අවු.63 ක් දක්වා අඩු කිරීමටත්, එම සේවකයින්ගේ වැන්දඹුවන්ට මෙම දීමනාව ලබා දීමටත් යෝජනා වී තිබුණු අතර දීමනාව රු.5,000 ක සිට රු.6,000 ක් දක්වා වැඩි කර තිබුණද, ඊට අදාළ වයස් සීමාව අවු.63 ක් දක්වා අඩු කිරීම හා වැන්දඹුවන්ට එම දීමනාව ලබාදීම ක්‍රියාත්මක වී නොතිබුණි. | වයස අවුරුදු 63 දක්වා අඩු කිරීමට හා වැන්දඹුවන්ට ගෙවීමක් පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ලබාගෙන නොමැති බැවින් ඒ අනුව කටයුතු කර නොමැත. | අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අදාළව විධිමත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 වර්ෂයේදී යෝජනා වූ වැන්දඹුවන්ට වන්දි ගෙවීම මේ වනවිටත් ක්‍රියාත්මක නොවීම හා 1980 ජූලි වැඩවර්ජනය හේතුවෙන් රැකියා අහිමි වී තම දරු පවුල් නඩත්තු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් සියදිවි හානි කරගත් සේවකයින් 138 දෙනෙකු පමණ වන අතර ඔවුන් හට කිසිදු පිළිසරණක් 2022 මැයි 31 දින වනවිටත් ලැබී නොතිබුණි. | 2013 වර්ෂය වන විට ජීවත්වන්නේ යැයි අපේක්ෂා කරන ලද ස්ථිර ජීවනෝපායක් නොමැති ජූලි වර්ජකයින් සඳහා පමණක් තම ආර්ථික දුෂ්කරතාවයන්ගෙන් මිදීම සඳහා සහනයක් වශයෙන් මෙම දීමනාව ලබා දී ඇත. සියදිවි නසාගත් පුද්ගලයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රතිපත්තිමය තීරණ ගෙන නොමැත. | අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අදාළව විධිමත් සැලසුම් සකස් කළ යුතු වීම. |

### 3.1.5 වත්කම් කළමනාකරණය

--------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු.4,229,677,479 ක් වූ වාහන පවරා ගන්නා ලෙස අදාල ආයතන දැනුවත් කර තිබුණ ද, එම පවරා දීම අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 150 ප්‍රකාරව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන විවිධ රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කල්බදු වාරික ගෙවා අවසන් වාහනවල හිමිකාරීත්වය අදාල ආයතන වෙත පවරා ගැනීමට කටයුතු කරන ලෙස එම රාජ්‍ය ආයතන හා අදාල ලංකා බැංකු ශාඛාවන් දැනුවත් කිරීමට කටයුතු කිරීමෙන් පසුව, එම වාහනවල වටිනාකම මෙම දෙපාර්තමේන්තුවේ වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය කල්බදු වාහන වල අයිතිය අදාළ ආයතන වෙත පවරාගෙන අවසන් බව තහවුරු කර ගත යුතු වීම. |
| (ආ) | 2014 ජූලි 23 දිනැති අංක 02/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5 ක කාලයකට පසුව පෞද්ගලික නමට පැවරෙන නමුත් එම මෝටර් සයිකල් පවරා ගැනීමේ | 2014/2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබා දුන් යතුරුපැදි/ස්කූටර් වසර 05 ඉක්මවූ පසු ඔවුන් වෙත අයිතිය පවරා දීම සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක BD/GPS/130/9/14/MC-8 හා | ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නියැලි නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි ඔවුන්ගේ පෞද්ගලික නමට පවරා දී ඇති බව සනාථ කර ගැනිමට කටයුතු කළ යුතු විම. |

කටයුතු අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

2019.11.22 දිනැතිව නිකුත් කර ඇති පොදු උපදෙස් පත්‍රිකාව මඟින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව වසර පහක් ඉක්මවූ පසු එම යතුරුපැදි වල අයිතිය පවරාදීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමක් අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ඇ) 2021 ජුනි 11 දින මුදල් අමාත්‍යාංශය විසින් ගිලන් රථ 50 ක්, වතුර බවුසර් 50 ක් හා ඩබල් කැබ් රථ 50 ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ කඩිනමින් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් 2021 ජුනි 29 දින ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මේ සමඟ ප්‍රාඩෝ රථ 225 ක් එම පදනම මත ලබා ගැනීමට ද අපේක්ෂා කර තිබුණි. එම ප්‍රාඩෝ රථ මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී වතුර බවුසර 2 ක්, ඩබල් කැබ් රථ 12 ක් නොමිලේ ලබා දීමට අදාල වාහන විකුණුම්කරු එකඟ වී තිබුණි.

ප්‍රාඩෝ රථ 225 රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ලබා නොගැනීමට තීරණය කිරීම නිසා අදාළ වාහන විකුණුම් සමාගම විසින් නොමිලේ ලබා දෙන බවට එකඟ වූ වතුර බවුසර 2 ක් සහ ඩබල් කැබ් රථ 12 ක් ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. 2021 ජුලි 28 දින මුදල් අමාත්‍යාංශය විසින් එම නොමිලේ ලබා දෙන බවට එකඟ වූ වතුර බවුසර 2 ට හා ඩබල් කැබ් රථ 12 ට මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය සංදේශයක් ඉදිරිපත් කර

| | | |
|---|---|---|
| තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 අගෝස්තු 18 දින ලැබී තිබුණි. වාහන ලබා ගැනීමේදී පළමුව තීරණය කර තිබුණු ඩබල් කැබ් රථ 50, ගිලන් රථ 50 හා වතුර බවුසර් 50 සඳහා පැරණි මිල ගණන් යටතේ මූල්‍ය කල්බදු වාරික මත ජාතික අයවැය දෙපාර්තමේන්තුව ලබාගෙන තිබුණි. පසුව අනුමැතිය ලැබී තිබුණු වතුර බවුසර් 02 ට හා ඩබල් කැබ් රථ 12 ක් ලබා ගැනීමට එ.ජ.ඩොලර් 461,606 ක අතිරේක වියදමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2021 ජූනි 29 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ කැබ් රථයක් එ.ජ.ඩොලර් 26,167 කට ලබා ගැනිමට තීරණය වූ අතර, නොමිලේ ලබා දීමට එකඟ වූ කැබ් රථ සඳහා ගෙවීම් කිරීමේදී එක් කැබ් රථයකට එ.ජ.ඩොලර් 44,484 ක් වී තිබුණි. ඒ අනුව, එක් කැබ් රථයක් සඳහා එ.ජ.ඩොලර් 18,317 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව, මුළු වැඩිපුර ගෙවීම් එ.ජ.ඩොලර් 219,804 ක් වි තිබුණි. | 2021.08.17 දිනැති අංක 21/1526/304/894-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් කැබ් රථයක මි.ර.ගැ.වටිනාකම ඇ.ඩො. 29,055.74කි (1,801,456/62=29,055.74) ප්‍රාඩෝ රථ 225 මිලදී ගැනීම අවලංගු කිරීමත් සමග වට්ටම් අහිමි කිරීම හා නොමිලේ ලබාදෙන ඒකක අඩු කිරීම් ඩබල් කැබ් රථ මිලට ගැනීමට අදාල ණයවර ලිපිවල ගැලපීම් කිරීම පිණිස ණයවර ලිපි සංශෝධනයේ පහසුව සඳහා එක් ණයවර ලිපියක මිලට ගනු ලබන ප්‍රමාණය පමණක් ද තවත් ණයවර ලිපියක පැහැදිලි කිරීමත් පමණක් ද සංශෝධනය කරන ලද අතර අනෙක් ණයවර ලිපි සංශෝධනය කිරීමක් නොමැතිව එසේම පවතින්නට ඉඩ තැබීම මත විගණන වාර්තාවේ සඳහන් මිල ගණන් පෙන්නුම් කෙරුණ ද සත්‍ය වශයෙන්ම එවැනි වැඩිපුර ගෙවීමක් සිදුවී නොමැත. | අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | (ii) 2021 දෙසැම්බර් 31 දින වන විට විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව කැබ් රථ 11 ක් රාජ්‍ය ආයතනවලින් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා 2022.06.30 දින වන විටත් අයවැය දෙපාර්තමේන්තුවේ රඳවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර රාජකාරි සඳහා වාහන මිලදී ගැනීමට අදාල අංක BD/GPS/13/01/01/2021 දරන ගොනුවට අනුව 2021.12.31 දින වන විට ඩබල් කැබ් රථ 184ක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී තිබූ නමුත් අත්‍යාවශ්‍ය හදිසි ප්‍රමුඛතා පදනම මත වාහන නිදහස් කිරීම සිදුකළ බැවින් 2021.12.31 දින වන විට කැබ් රථ 11ක් ඉතිරි වී තිබූ නමුත් එයින් කැබ් රථ 6 ක් දැනටමත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙත නිදහස් කර ඇති අතර ඉතිරි කැබ් රථ 5 එවැනි වාහන අත්‍යාවශ්‍යවම පවතින ක්ෂේත්‍ර රාජකාරි වල නියැලෙන ආයතනයන් සඳහා ලබා දීමට භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |
| | (iii) 2021 වර්ෂය තුළ ආයතන වලට පවරා දුන් කල්බදු වාහන අදාළ ආයතන විසින් භාරගත් බවට තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ආයතන වලට පවරා දුන් වාහන සඳහා එම ආයතන විසින් වාහන භාරගත් බවට තහවුරු කරමින් ලිපි ලැබෙමින් පවතී. | අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |
| (ඇ) | 2021 වර්ෂයේදී ගෙන්වන ලද වාහන 164 ක් රාජ්‍ය ආයතන අතර බෙදාදීමේදී එම ආයතන කරන ලද ඉල්ලීම් සලකා ඔවුන්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛස්ථානය දෙමින් වාහන ලබාදීමට යෝජනා වී තිබුණත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් නොකරන ලද ඩබල් කැබ් රථ 05ක් එම ආයතන වෙත ලබාදීමට කටයුතු කර තිබුණි. තවද, ප්‍රාදේශීය සභාව වෙත ජල බවුසර් 32ක් ලබා දී තිබුණත් එම සභාවන් විසින් වතුර බවුසර් සඳහා ඉල්ලීම් කර තිබුණු බව සනාථ කරන | අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා හා ජනාධිපති ලේකම්තුමා සමඟ පැවති විවිධ රැස්වීම් වලදී ලැබුනු උපදෙස් හා අතිගරු ජනාධිපතිතුමාගේ "ගම සමඟ පිළිසඳර" වැඩසටහන් සඳහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් සහභාගි වූ මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ලැබුනු වාචික උපදෙස් හා ඇතිකරගනු ලැබූ එකඟතාවයන් හා ජනාධිපති කාර්යාලයේදි හා අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පැවති සංවර්ධන වැඩසටහන් පිළිබඳ රැස්වීම් වලදී ඇතිකරගනු ලැබූ වාචික | අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | එකඟතාවයන් මත හා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙතින් ලැබුනු ඉල්ලීම් අනුව වාහන වෙන් කරදීම සිදුකරන ලද අතර, එම හැම ආයතනයක්ම ප්‍රතික්ෂේප කිරීමකින් තොරව වාහන ලබාගත් බව ද කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඉ) | ඉහත කී 1990 සුවසැරිය පදනම සඳහා මූල්‍ය කල්බදු ගිවිසුම යටතේ ලබා ගත් ටොයෝටා ගිලන් රථ 25 ක් භාවිතයට සුදුසු පරිදි පිළියෙළ කිරීම සඳහා රු. මිලියන 25 ක ප්‍රතිපාදන අවශ්‍ය බව අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණ ද, ප්‍රතිපාදන ලබා නොදීම මත එම රථ භාවිතයට ගෙන නොතිබුණි. තවද, 2022 මැයි 25 දින වන විටත් මෙම ගිලන් රථ සැපයුම්කාර සමාගමේ වාහන අංගනයෙන් ඉවත් කරගෙන නොමැති බවත් ඒවා ඉතා ඉක්මනින් ඉවත් කර ගන්නා ලෙසත් සුවසැරිය පදනම වෙත දන්වා තිබුණි. ඒ අනුව, අවශ්‍යතාවය හා අදාල පිරිවිතරයන් පිළිබඳ අනවබෝධයකින් ගිලන්රථ 25 ක් සඳහා රු. මිලියන 103.38 ක් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. | රජයේ ආයතනවල අවශ්‍යතා සඳහා වාහන ගෙන්වීම පිළිබඳ අංක 21/1440/304/094 දරන 2021.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අංක 21/1526/304/094-ii දරන 2021.08.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගෙන්වන ලද ගිලන් රථ 50 න් 25 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ද ඉතිරි ගිලන් රථ 25 සුවසැරිය පදනම වෙත ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක TRS/V/Gen/II දරන 2021.09.27 දිනැති ඉල්ලීම මත ලබා දී තිබේ. සුවසැරිය පදනම සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් සුවසැරිය පදනමේ ඉල්ලිමක් මේ සඳහා අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි. | අවශ්‍යතාවයට සරිලන පරිදි අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් වාහන ලබා ගැනීම සිදු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 6 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 9 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 2 ක් ලෙස එකතුව තනතුරු 17 ක් පුරප්පාඩු පැවතුණි. | 2022.05.09 දින වන විට ජ්‍යේෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් , ද්විතික මට්ටමේ පුරප්පාඩු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පුරප්පාඩු 07 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. තවද, | පුරප්පාඩු පිරවීමට හෝ අනවශ්‍ය කාර්ය මණ්ඩලය සිටීනම් කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගත යුතු වීම. |

2022.04.19 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව තෘතීයික මට්ටමේ තනතුරු 04 ක් (රියදුරු 02, කාර්යාල කාර්ය සහයක 02 ) යටපත් කර ඇත.